# දහම්පාසල් අධ්‍යාපනයේ නිරතවීම්

**වයි. එම්. ආර්. කුමාරිහාමි.**[1]


## සංක්ෂේපය

ගුණනුවණින් පිරි මිනිසකු වීමට නම් විෂය සමගාමී දැනුම මෙන්ම ආගම දහම පිළිබඳ දැනුම ද ඉතා වැදගත් වේ. දිනෙන් දින සමාජ පිරිහීමත් දක්නට ලැබුණ ද දහම් අධ්‍යාපනය කෙරෙහි දෙමාපියන්ගේ හා දරුවන්ගේ අවධානය යොමු වී නොමැති බව පෙනේ. පෙර වර්ෂයන්ට සාපේක්ෂව ක්‍රමයෙන් දහම් පාසල් අධ්‍යාපනයේ නිරත වීම අඩු වීම ගැටලුවක් බවට පත්ව තිබේ. සිසුන්ගේ දහම් පාසල් අධ්‍යාපනයේ ප්‍රවණතාවයන් හා ඊට බලපාන සාධක අරමුණු කර ගනිමින් වයඹ,පොල්පිතිගම කොට්ඨාසයේ දහම් පාසල් තුනක් වන ශ්‍රී චන්ද්‍රානන්ද දහම් පාසල, ශ්‍රී ගුණානන්ද රිවි දින දහම් පාසල, මාදුගල ශ්‍රී සුවින්ද්‍රාරාම දහම් පාසල ආශ්‍රයෙන් වර්ෂ පහක් තුළ පළමු ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා කොපමණ ප්‍රමාණයක් ලියාපදිංචි වී තිබේ ද සතිපතා පැමිණීමේ නැඹුරුතාවය කොපමණද යන්න ද්විතියික හා ප්‍රාථමික දත්ත මූලාශ්‍ර තුළින් ලබාගත් අතර දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්, දහම් පාසල් ආචාර්යවරුන් හා සිසුන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා ප්‍රාථමික දත්ත රැස්කර ගන්නා ලදි. එහි දී අනාවරණය වූයේ මුල් වර්ෂවලට සාපේක්ෂව ක්‍රමයෙන් දහම් පාසල් සිසුන්ගේ ප්‍රමාණය 40% ක් පමණ අඩු වී ඇති බවයි. ඒ අතරින් 10 සහ 11 ශ්‍රේණිවල සිසුන්ගේත්, 5 ශ්‍රේණිය සිසුන්ගේත් ප්‍රමාණයන් ඉතා ඉහළ අඩු වීමක් දක්නට ලැබුණි. එමෙන්ම දහම් පාසල් පැමිණෙන සිසුන්ගෙත් 45% දහම් පාසල් අවසාන පරික්ෂණය සඳහාත් ධර්මාචාර්ය විභාගය සඳහා 20% ක් වැනි ප්‍රකාශිතයක් පෙනී සිටිනු ලබන බවයි. මෙලෙස දහම් පාසල් අධ්‍යාපනයෙන් ක්‍රමයෙන්  ඈත්වීම සඳහා බලපාන සාධක ලෙස අ.පො.ස සා.පෙළ හා ශිෂ්‍යත්වය සඳහාත්, ගණිත, ඉංග්‍රීසි වැනි විෂයන් සඳහාත් අමතර පන්තිවලට සහභාගී වීම, දහම් පාසල් සඳහා පවතින භෞතික හා මානව සම්පත් හිඟකම, සිසුන් හා දෙමාපියන් දක්වන ආකල්ප හා උනන්දුව අඩුවීමත් දැක්විය හැකිය. දහම් අධ්‍යාපනය ලබාගන්නා ප්‍රතිශතය ඉහළ නැංවීම සඳහා ඉරුදින දහම් පාසල් කාලය තුළ පන්ති නොපැවත්වීම, දහම් පාසල්වල මානව සහ භෞතික සම්පත් සංවර්ධනය, පාසල් මට්ටමින් ගම් මට්ටමින් දැනුවත් කිරීම, දහම් අධ්‍යාපනයට ඇති ඉඩ ප්‍රස්තා පුළුල් කිරීම මෙන්ම පර්ෂද මූලස්ථාන ශක්තිමත් කිරීම සිදු කළ යුතුයි.


**මුඛ්‍ය පද :** දහම් පාසල් අධ්‍යාපනය, දහම් පාසල, දහම් පාසල් සිසුන්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, yaparasika7@gmail.com